සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**අවසාන වාර පරීක්ෂණය 2015**

# ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය

**07 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

- අංක 01 05 දක්වා වූ පහත සඳහන් ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.

01 විභාගයකට සූදානම් වීමේ දී කාල සටහනකට අනුව ඉගෙනීමේ කටයුතු කළහොත් ඔබගේ අරමුණ ඉටුකර ගැනීම පහසු ය. ( )

02 වටිනා කාලය ඔබටත්, අන්‍යයන්ටත් ප්‍රයෝජනයක්, යහපතක් නොමැතිව ගතවී යාම අපරාධයකි. ( )

03 සංස්කෘතිය යනු සමාජයක ජනතාවගේ ජීවත්වීමේ ක්‍රමයයි. ( )

04 විවේක කාලය ක්‍රීඩාවල යෙදීමෙන් එතරම් ප්‍රයෝජනයක් නොලැබේ. ( )

05 සාමාජිකයන් කොතෙක් ගුණගරුක වුවද සමාජයක යහපැවැත්මක් රඳා නොපවතී.( )

- නිවැරදි වචනය යොදා අංක 06 10 දක්වා වූ ප්‍රශ්නවල හිස්තැන් සම්පූර්ණ කරන්න.

06 දුනුම ගබඩා කළ තැන් ලෙස ........................................................ ද, දත්ත ගබඩා ලෙස .................................................. ද හැඳින්විය හැකිය.

07 සෑම කෙනෙක්ම තම ........................................................ අගය කරනවා මෙන්ම අන්‍ය .................................................... ද ගරු කළ යුතුය.

08 ජාතික කොඩිය ........................................................ තැබිය යුත්තේ එහි සිරස් තීරු දෙක කොඩි ගස .................................................. සිටිනා පරිදිය.

09 අප රටේ ජීවත්වන ජනතාව ........................................................ වශයෙන් එක්සත්ව, එකමුතුව කටයුතු කිරීම රටේ ........................................................ හේතුවනු ඇත.

10 ඔබ .................................................... ඕනෑම අයෙකු වීමට, ඕනෑම දෙයක් කිරීමට ඔබට .................................................................. ඇත.

- අංක 11  15 දක්වා වූ ප්‍රශ්නවලට වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

(සාමාජිකයින් / හිතවතුන් / පැහැර හැරීම / ඉටුකිරීම / සාමාජිකයෝ / උරුමක්කාරයෝ / සංස්කෘතිය / ඉතිහාසය / තියුණු / විමසුම්)

11 අම්මා, තාත්තා, සහෝදර සහෝදරියන්, ආච්චී, සීයා ඇතුළු පිරිස පවුලක .................................................... වෙති.

12 සමාජයේ ජීවත්වීමේ දී පරිසරය තුළින් විවිධ ක්‍රියාකාරකම් ඔස්සේ ............................ ඉගෙනගැනීම සිදුකරයි.

13 අපට දකින්නට, අසන්නට ලැබෙන දේ කෙරෙහි ............................................ නුවණින් සිතීම හා බැලීම වැදගත් වේ.

14 එකිනෙකාගේ යුතුකම්, වගකීම් ........................................................ මගින් පුද්ගලයන් අතර සුහදතාව වර්ධනය වී සමාජය තුළ අන්තර් පුද්ගල සබඳතා ගොඩනැගේ.

15 යහපත් පවුලක මනා පැවැත්ම සඳහා පවුලේ ................................................ අතර හොඳ සබඳතා පැවැත්විය යුතුය.

- අංක 16  20 දක්වා වූ ප්‍රශ්නවලට වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

16 පුද්ගලයෙකු සමාජයට හුරුකිරීමේ හා හොඳ සමාජ ජීවිතයක් ගතකිරීමට අවශ්‍ය මූලික පදනම සකස් කිරීමේ කාර්යය ඉටුකරනු ලබන්නේ (පවුලයි / පාසලයි / පන්සලයි)

17 ශ්‍රී ලංකාව (1948 / 1972 / 1977) දී ජනරජයක් බවට පත්වීමෙන් පසු දැනට භාවිතා කරනු ලබන රාජ්‍ය ලාංඡනය භාවිතයට ගැණින.

18 (අධ්‍යාපනය / නීරෝගිකම / නායකත්වය) ලැබීම මගින් හැකියා වර්ධනය කරගෙන අනාගතයේ දී යහපත් සමාජ ජීවිතයක් ගතකිරීමට ඔබට හැකියාවක් ලැබෙනු ඇත.

19 නිරන්තරව පවුලේ සමගිය සුරැකීම හා සදාචාරාත්මක හැසිරීම පවුලේ සාමාජිකයන් වෙත පැවරෙන (වගකීමකි / යුතුකමකි / අයිතිවාසිකමකි)

20 (ආත්මාභිමානය / ආත්ම විශ්වාසය / ආත්ම තෘප්තිය) යනු ඔබට ඇති සුවිශේෂී ශ්‍රේෂ්ඨ ගුණ නිසා ඇතිවන උසස් හැඟීමකි.

(2 x 20 = 40)

The National e-learning Portal for The General Education

# II කොටස

- ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

01 (1) පූජනීය ස්ථානයක දී අනුගමනය කළ යුතු සිරිත් 3 ක් දක්වන්න. (ල. 03)

(2) අපේ සංස්කෘතික අංග 4 ක් දක්වන්න. (ල. 02)

(3) ශ්‍රී ලාංකිකයන් වන අපගේ පහත සඳහන් ජාතික සංකල්ප නම් කරන්න.

(ජාතික පුෂ්පය / ජාතික වෘක්ෂය / ජාතික පක්ෂියා / ජාතික ක්‍රීඩාව) (ල. 04)

(4) ''ශ්‍රී ලංකා සංස්කෘතිය විවිධ ජාතීන්ගේ සංස්කෘතික අංගයන්ගෙන් පෝෂණය වී ඇත.'' පැහැදිලි කරන්න. (ල. 06)

02 (1) ජනරජ ලාංඡනය භාවිතා කරන ස්ථාන හෝ අවස්ථා 3 ක් දක්වන්න. (ල. 03)

(2) වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා (i) සිට (iv) දක්වා පින්තූර පිළිවෙලින් නම් කරන්න.

(නටරාජා / පාර්වතී දේවිය / සමාධි පිළිමය / අවුකන පිළිමය / ගල්විහාරයේ සැතපෙන පිළිමය / ඉසුරුමුණි පෙම් යුවල / මුරගල) (ල. 04)



(i)



(ii)



(iii)



(iv)

(3) ළමා අයිතිවාසිකම් කඩවන අවස්ථා 2 ක් දක්වා ඒ නිසා අහිමිවන ළමා අයිතිවාසිකම් මොනවාදැයි විස්තර කරන්න. (ල. 08)

03 (1) ප්‍රධාන ආගම් හා ආගමික ආයතන පහත වගුවේ දක්වා ඇත. එය නිවැරදිව සම්පූර්ණ කරන්න. (ල. 04)

| ප්‍රධාන ආගම් | ආගමික ආයතන |
|---|---|
| බෞද්ධ | 1. ................................................ |
| 2. ................................................ | පල්ලිය |
| හින්දු | 3. ................................................ |
| 4. ................................................ | මස්ජිදය |

(2) පහත සඳහන් දිනයන් ආගමික වශයෙන් වැදගත් වන්නේ කවර ආගමික බැතිමතුන් සම්බන්ධයෙන් ද?

පසළොස්වක පෝය දිනය / මහා ශිව රාත්‍රී දිනය / නබිනායක තුමාගේ උපන් දිනය / මහ සිකුරාදා දිනය) (ල. 04)

(3) පරිසරය රැකගැනීම මුළු මහත් ජනතාවගේ සහභාගීත්වයෙන් සිදුවිය යුත්තකි. මේ පිළිබඳව ඔබේ අදහස් දක්වන්න. (ල. 07)

04 (1) පාසලේ දී අන්තර් සබඳතා ගොඩනැගෙන කණ්ඩායම් 4 ක් නම් කරන්න. (ල. 04)

(2) ලෝක ජන සමාජය තුළ පුළුල් අන්තර් සබඳතාවයක් ඇතිකිරීමට හැකි ජනමාධ්‍ය 4 ක් දක්වන්න. (ල. 04)

(3) ප්‍රධාන ජනමාධ්‍ය පවත්වාගෙන යාමෙන් අපට ලැබෙන ප්‍රයෝජන 3 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 07)

05 (1) පවුල නමැති සමාජ ඒකකය තුළ ඥාතීත්වය පවත්වාගෙන යාම නිසා සාමාජිකයන්ට අත්වන ප්‍රයෝජන 3 ක් සඳහන් කරන්න. (ල. 03)

(2) න්‍යෂ්ටික පවුලක හා විස්තෘත පවුලක වෙනස පැහැදිලි කරන්න. (ල. 05)

(3) විස්තෘත පවුල් ඒකකයක ඇති වැදගත්කම කරුණු 3 ක් යටතේ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 07)

The National e-learning Portal for The General Education